# මනඃකල්පිත යාළුවා



සයුරි නිම්සරා නානායක්කාර

# මනඃකල්පිත යාළුවා

**කතෘගේ නම**

සයුරි නිම්සරා නානායක්කාර

**කතෘගේ වෙනත් කෘති**

ඇස ගැන කතාවක්

**ඉගෙනුම ලබන පංතිය**

7 වසර C

**පාසල**

මහ/මහමායා විදුහල

**කෘතිය පළ කරන දිනය**

2026

**ISBN අංකය**

ISBN - 978624211160-5

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දෑයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළඳා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ.

ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල

දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව

එකෝමත් එක කාලෙක ලස්සනම ලස්සන දවසක් උදා වුණා. සදුනි, සචිනි කියන්නෙ හොඳම යාළුවෝ දෙන්නෙක්. ඒත් අද ශිෂ්‍ය නායිකා බැජ් පළන්දන දවස. එදා සචිනිගේ අම්මයි තාත්තයි ඇවිල්ලා හිටියා. මොකද සචිනි ශිෂ්‍ය නායිකාවක් නිසා. ඒත් සදුනි ශිෂ්‍ය නායිකාවක් නෙවෙයි. ඉතින් සදුනිට ඊර්ෂ්‍යාව ගලාගෙන ආවා.



සචිනි බැජ් එක පළඳින විටම සඳුනිට ඇඬුණා. සචිනිගේ අම්මයි තාත්තයි හිතුවේ සඳුනිට සතුටු කඳුළු ආවා කියලා. ඒත් එහෙම නෙවෙයි දුක, තරහ, ඊර්ෂ්‍යාව පිරුණු සඳුනිගේ හිත සඳුනිටම පාලනය කරගන්න බැරි වුණා. මටත් ශිෂ්‍ය නායිකාවක් වෙන්න තිබුණා" සඳුනිට හිතුනා. සඳුනිට නපුරුම නපුරු අදහසක් පුංචි හිතට ආවා.



ඔන්න ඉතින් උත්සවය අවසන් වී හැමෝම පිට්ටනියේ සෙල්ලම් කරන්න ගියා. දෙමව්පියන් රැස්වීමට ප්‍රධාන ශාලාවට ගියා. සදුනිත් දුකින්ම පිට්ටනියට යද්දී සචිනි ඇවිත් කිව්වා "එන්න අපි සෙල්ලම් කරමු, ඊළඟ පාර ඔයත් ශිෂ්‍ය නායිකාවක් වෙන්න" සදුනිට තව තරහ වැඩි වුණා.



"සචිනි අපි අර පේන කැලෑවට යමුද?" සදුනි ඇහුවා. "ඒත් අම්මා මට කිව්වා කොහේවත් යන්න එපා කියලා". "එක පාරක් ගිහින් ඉක්මනට එමුකෝ" සදුනි ඉල්ලීමක් කළා. සදුනිගේ ඉල්ලීම මඟ හරින්න බැරි නිසා සදුනියි සචිනියි කැලයට ගියා. එතන ලොකු බෑවුමක් තිබුණා. සදුනි සචිනිට හොඳටම බැන්නා. රණ්ඩු වෙලා තරහ වුණා. ඊට පස්සේ සදුනි සචිනිගේ බෑජ් එක ගලවලා ගත්තා. සචිනිව බෑවුමෙන් පහළට තල්ලු කරලා දැම්මා. සචිනිගේ අම්මයි තාත්තයි සචිනිව හොයනවා. ඉක්මනටම සදුනි කැලයෙන් එළියට ආවා.



සචිනිගේ දෙමව්පියන් ඇවිත් "සචිනි කෝ" කියා ඇහුවත් සදුනි කිසිම දෙයක් පැවසුවේ නැත. එම කැලෑවේ ගොවිතැන් කරමින් සිටි ගොවියෙකුට සචිනිගේ මළ සිරුර හමුවුණා. ඔහු සචිනිගේ දෙමව්පියන්ට එම මළ සිරුර පෙන්වා දුන්නා. දෙමව්පියන් ඇඬුවා. "කවුද මෙහෙම කළේ, එයා ටිකකට කලින් හොඳට හිටියනේ." සචිනිගේ මළ ගෙදරට සදුනි ගියා. සදුනි බොරුවට කිඹුල් කඳුළු හැඬුවා. ඔන්න ඉතින් දවස් වේගයෙන් ගෙවිලා ගියා.



සදුනිගේ අම්මා වසර  පහකට ඉහතදී නැතිවෙලා තියෙනවා. ඒක හදිසි අනතුරක් කියලා තමයි තාත්තා කිව්වේ. එයාට දැන් ඉන්නේ තාත්තා විතරයි. ඔන්න ඉතින් දැන් සදුනිගේ කාමරය හොඳටම අපිරිසිදු වෙලා. තාත්තා එයාගේ කාමරේ පිරිසිදු කරන්න සදුනිට යන්න කිව්වා. සදුනි කාමරයෙන් එළියට ගියා. තාත්තා ඇයගේ ඇඳ ඇතිරිල්ල උස්සා බලන විට අන්දමන්ද වුණා.



එතන තිබ්බේ සචිනිගේ ශිෂ්‍ය නායිකා බැජ් එක. තාත්තා හොඳටම පුදුම වුණා. තාත්තා එළියට ගොස් සදුනිගෙන් විමසුවේ "කොහොමද සචිනිගේ බැජ් එක ඔය ළඟට ආවේ?" කියලා. සදුනි බොරුවට කිව්වා "එයා මට කැලෑවට යන්න කලින් මේක ටිකක් බලන්න දුන්නා" කියලා. තාත්තා කොහොමත් දන්නවා සචිනිව මැරුවේ සදුනි කියලා, මොකද සදුනි දන්නේ කොහොමද සචිනි කැලේට ගියා කියලා." සදුනිගේ තාත්තා බය වුණා මේක හැමෝම දැන ගනියි කියලා.



ඒක නිසා එයා වෙන ගෙදරකට යන්න ඕනේ කියලා හිතුවා. ඒත් ඒක තිබුණේ ගොඩක් දුර. ඒත් එයාලා කොහේට ගියත් සචිනිගේ ආත්මය එයාලා පස්සෙන්ම එනවා. "කලින් ගෙදරනන් අත්භූත සිදුවීම් වුණේ නැහැ. මේ ගෙදර එහෙම වෙයිද දන්නේ නැහැ" තාත්තා හිතුවා. ඔන්න ඉතින් සඳුනි නිදාගන්න ගියා. තාත්තා රූපවාහිනිය නරඹනවා. එකපාරටම සඳුනිගේ කාමරේ දොර ඇරුණ සද්දේ ඇහුණා. තාත්තා හිතුවේ ඒ නිකන් කියලා.



එකපාරටම සදුනි දොර ඇරගෙන ඒ ළඟ තියෙන කැලයට ඇවිදගෙන ගියා. සදුනි ඒ ළඟ තිබ්බ ගඟට පනින්න යද්දීම තාත්තා ඇවිත් සදුනිව අල්ල ගත්තා. ඊට පස්සේ ගෙදර ගියා. තාත්තා හිතුවා සදුනිට සවිනිගේ ආත්මය වැහිලා කියලා. ගෙදර බඩු එකින් එක නැති වෙනවා. ඒක ගැන තාත්තාට දැනිලයි තිබ්බේ. සදුනි හීනෙන් ඇවිදිනවා, කතා කරනවා හරිම භයානකයි. "තාත්තේ අන්න සවිනි ඉන්නවා. එයා මට කැලෑවට එන්න කියලා කියනවා. මම යන්නද?" සදුනි ඇහුවා. ඒත් තාත්තාට කවුරුවත් පෙනුණේ නැහැ.



සඳුනිව තාත්තා අල්ල ගත්තා. "ඔයා කොහේවත් යන්න එපා" කියලා තාත්තා කිව්වා. "සචිනි හදන්නේ ඔයාව මරන්න. මම දන්නවා ඔයා සචිනි දුවව මැරුවා කියලා" තාත්තා සඳුනිට කිව්වා. "ඔව්, මට සමාවෙන්න. මම ඒක හිතලා නෙවෙයි කළේ" සඳුනි කිව්වා. සචිනිගේ කට හඬ දෝංකාර දෙනවා. ඇය මෙහෙම කිව්වා "මට ඒවායින් වැඩක් නැහැ". එකපාරටම ලොකු ගින්නක් ඇවිත් මුළු ගෙදරම පිච්චිලා. සඳුනියි, සඳුනිගේ තාත්තායි ගින්නට අහුවෙලා පිච්චිලා මැරුණා. ආය කිසිම දිනක එම පළාතට පස් පෑගුවේ නැහැ. එම පළාතම සචිනි විසින් ශාපයට ලක් කළා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දෑයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්නමගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ගා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්ථ වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළඳා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාරය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN - 978624211160-5